**නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 01) - 2021**

නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (අදියර 01) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රංශ සංවර්ධන ආයතනය (Agence Francaise De Development) අතර 2016 ජුනි 01 දින එළඹි අංක සීඑල්කේ 1013 – 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (එච්) වගන්තිය සහ 2016 මාර්තු 16 දින එළඹි අංක සීඑල්කේ 1013-02 එල් දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය පහසුකම් හා මූල්‍ය ගිවිසුම් අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු (අ) අප ජලය රැස්කිරීම හා පිරිපහදු පද්ධති ව්‍යාප්ත කිරීම සහ මීගමුව මහ නගර සභා බල ප්‍රදේශයේ 73,000 ක් වූ ජනතාවට සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා වැඩි දියුණු කිරීම (ආ) ජල හා සනීපාරක්ෂ අංශයේ ව්‍යුහය වැඩි දියුණු කිරීම හා විශ්ලේෂණය කිරීම (ඇ) දරිද්‍රතාව පිටු දැකීම සඳහා අවැසි දිළිඳු හිතකාමී ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මගින් වරප්‍රසාද නොලත් නිවැසියන්ට සේවා ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා සැලසීම (ඈ) වෙරළාශ්‍රිත හා නාවික පරිසර පද්ධති ආරක්ෂාව සහ ජෛව විවිධත්ව නඩත්තුව සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,739.81 කට සමාන යූරෝ මිලියන 107.70 ක් වන අතර ඉන් රු.මිලියන 13,224 කට සමාන යූරෝ මිලියන 76 ක් ණයක් වශයෙන් සහ රු.මිලියන 991.81 කට සමාන යූරෝ මිලියන 5.70 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යායනය කිරීමට ප්‍රංශ සංවර්ධන ආයතනය එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 4,524 කට සමාන යූරෝ මිලියන 26 ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජුනි 01 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය හා සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2 භෞතික කාර්ය සාධනය**

**2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| | ක්‍රියාකාරකම් | 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත | සත්‍ය | | |
| (අ) | ප්‍රධාන පොම්පාගාරයට මලාපවහන ජාලය සම්බන්ධ කිරීම සඳහා පයිප්ප සැපයීම හා එලීම සහ මීගමුව නගර සභාවේ ප්‍රමුඛ ප්‍රදේශ සඳහා පොම්පාගාර ඉදිකිරීම. | 2022 වර්ෂයේ දෙසැම්බර් මස වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. | ලංසු ලේඛණ සඳහා SCAP අනුමැතිය ලැබෙන තුරු සිටී. | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව මෙම කොන්ත්‍රාත්තුව 2022 දෙසැම්බර් වන විට ප්‍රදානය කිරීමට අපේක්ෂිතය. කෙසේ වුවද, රටේ පවත්නා ආර්ථික අස්ථාවරත්වය නිසා AFD විසින් ණය උපයෝජනය අත්හිටුවා ඇත. එම නිසා ලංසු කැඳවීම සඳහා ටෙන්ඩර් ලියවිලි නිකුත් නොකිරීමට තීරණය කරන ලදී. | ණය කාල සීමාව 2022 ජුනි මස අවසන් වන බැවින් ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | අපජල අපහරණ පිරියත හා මීගමුව අපජල කළමනාකරණ පද්ධතිය සඳහා පිටවාන සහ මලාපවහන පද්ධතියට සේවා සැපයීම සඳහා ගෘහස්ථ සබඳතා ලබා දීම සැලසුම් කිරීම හා ඉදිකිරීම. | 2018 ජුනි මස කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලැසුම් කර තිබුණි. | ලංසු කැඳවීම සඳහා AFD අනුමැතිය ලැබෙනතරු සිටී. | මෙම ප්‍රමාදයට ආරම්භක හේතුව සැලසුම් හා අධීක්ෂණය උපදේශන කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම වේ. කෙසේ වුවද, අප්‍රේල් 21 සිදු වීම හා කොවිඩ් 19 වසංගතය මත ප්‍රාථමික සැලැසුම හා ලංසු ලේඛන පිළියෙල කිරීම නිම කිරීමට නොහැකි විය. සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2023 පෙබරවාරි මස මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අපේක්ෂිතය. | ණය කාල සීමාව 2022 ජුනි මස අවසන් වන බැවින් ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන අඩු ආදායම් ප්‍රජාවගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම. | 2018 ජුනි මස වන විට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබුණි. | 2022 මැයි 25 දින වන විටත් කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ අංශය මූලික වැඩ සැලැස්ම පිළියෙළ කළ අතර ගෘහ ඒකක සමීක්ෂණය නිම කර ඇත. කෙසේ වුවද, ණය ගිවිසුම ප්‍රකාරව NGO වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ යුතුයැයි AFD අවධාරණය කරන ලදී. සාකච්ජා කෙරීගෙන යමින් පවතී. සමස්ත ව්‍යාපෘතියේ ඉලක්ක කෙරෙහි ප්‍රමාදය බල නොපායි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනමින් කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | මලාපවහන කළමනාකරණ කුසලතා වර්ධන උපදේශනය | 2018 නොවැම්බර් මස වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. | ලංසු කැඳවීම සඳහා AFD අනුමැතිය ලැබෙනතෙක් සිටී. | ආරම්භක ප්‍රසම්පාදන ප්‍රමාදය නිසා PIEC කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වූ අතර මෙම කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛන පිළියෙල කිරීම. PIEC උපදේශක සිදුකල යුතු වීම මෙහි කාර්යය ආරම්භ කිරීම ප්‍රමාද වීමට බලපාන ලදී. SMSDCP - 1 හි කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලියවිලි ඇගයීම් කෙරෙමින් පවතින අතර යෝජනා ඉල්ලීම් කෙටුම්පත ලේඛන අනුමැතිය සඳහා 2022.02.18 දිනත් AFD හි මත විමසුම සඳහා 2022.02.21 දිනත් යවන ලදී.<br><br>SMSDCP 2 - ටෙන්ඩර මණ්ඩලයේ අනුමැතිය ලද අතර ටෙන්ඩර කැඳවීම 2022.04.06 දින ප්‍රසිද්ධියට පත් කරන ලදී. SMSDCP 3 – NWSDB හි පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වර්ධනය කිරීමේ ටෙන්ඩර් ලියවිලි පිළියෙල කිරීම නිම කර ඇති අතර ලේඛන අනුමැතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් ලැබුනද එයට AFD එකඟාව ලැබී නොමැත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ඉ) | ඉඩම් අත්පත් කර ගැනීම. | මීගමුව ඉඩම් 13, ගාල්ලේ ඉඩම් 17 ක් හා උණවටුන ඉඩම් 07 ක් | ඉඩම් අත්පත් කර ගැනීම් ක්‍රියාවලිය සිදු කරමින් පවතී. | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ඉඩම්වලට ප්‍රවිශ්ටවීමේ හැකියාව තහවුරු කර ගෙන ඇත. | ඉඩම්වල හිමිකම පවරා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ගිවිසුම් අත්සන් කරන ලද 2016 වර්ෂයේ සිට වර්ෂ දෙකකට පසු, එනම් 2018 වර්ෂයේ ණය උපයෝජනය ආරම්භ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ණය නියෝජිතායතනය විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය නොකළ ණය ශේෂය මත බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 405.43 ක් අය කරගෙන තිබුණි. | CLK 1013 01 කේ දරන ණය ගිවිසුමේ 6.1 අ පරිදි පවත්නා මුළු ණය ශේෂය මත සහ යම් ණය උපයෝජන ඉල්ලීම් අනුව ණයහිමි විසින් උපයෝජනය කිරීමට යෝජිත වටිනාකම මත බැඳීම් ගාස්තුව සියයට 0.5 ක් වේ. | ව්‍යාපෘති කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා කල යුතුය. |
| (ආ) | ප්‍රතිපත්ති හා ආයතනික වැඩදියුණුකිරීමේ උපදේශන කොන්ත්‍රාත්තුව විසින් 2020 වර්ෂයේදී NWSDB හි ගිණුම්කරණ පද්ධතිය වර්ධනය කිරීමට ඩිලිවරබල් 3, ඩිලිවරබල් 4, ඩිලිවරබල් 5 ලෙසත් NWSDB හි මලාපවහන කළමණාකරණ කුසලතා වර්ධනය කිරීමට ඩිලිවරබල් 7 හා ඩිලිවරබල් 8 ලෙසත් රු.මිලියන 54.66 ක් වැය කර වාර්තා ඉදිරිපත් කර තිබුණි .කෙසේ වුවද ,එම වාර්තාවල අඩංගු නිර්දේශ NWSDB විසින් 2022 මැයි 25 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල අංශ සමඟ සහභාගීත්වයෙන් ව්‍යාපෘති කළමනාකරණ අංශය ඩිලිවරබල් 3,4,5 සකස් කළ අතර ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දී ඇත .ඩිලිවරබල් 7 සහ 8 හි යෝජනා SMSDC පැකේජ හා සමගාමීව ක්‍රියාත්මක කොට භාවිත කරයි ඒ .අනුව ඩිලිවරබල්7,8 හි යෝජනා ජල පිළිසැකසුම් අංශයේ ධාරිතාව වර්ධනය සඳහා යොදා ගෙන ඇත. | NWSDB විසින් ව්‍යාපෘති විෂය පථය ඵලදායිව ආර්ථිකව හා කාර්යක්ෂමව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ප්‍රතිපත්ති හා ආයතනික වර්ධන උපදේශක කොන්ත්‍රාත්තුවේ විෂය පථය අඩු කිරීමෙන් ඇතිවන ඉතිරිවීම යොදාගෙන විචලන නියෝග 3මඟින් NWSDB සඳහා මානව සම්පත් උපදේශකවරයෙක් බඳවා ගැනීමට ව්‍යාපෘතිය අනුමත කර තිබුණි. | මෙම ඉල්ලීම අතිරේක සාමාන්‍යාධිකාරී )P&Pවෙතින් ලද අතර ( විචලතා නියෝග කමිටුවේ අනුමැතියමත මාසයක් සඳහා පමණක් රු400,000. ක් ගෙවන ලදී . | විෂය පථය තුළ ව්‍යාපෘතියේ වියදම් කළමනාකරණය කර ගත යුතුය. |

## 2.3 මතභේදයට තුඩු දුන් කරුණු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැය ලෙජර ඇස්තමේන්තුව ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දේශීය අරමුදල් උපයෝජනය රු.මිලියන 26.91 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.මිලියන 29.28 ක් විය. | වෙනස සඳහ ගැළපුම් කර ඇත. | වැය ලෙජර ඇස්තමේන්තු තුළ ව්‍යාපාතිය වියදම් කළමනාකරණය කළ යුතුය. |

## 2.4 පෙර විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද නොවිසඳුනු ගැටළු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ අපජල පිරිපහදු පිරියත ඉදිකිරීමට සැලසුම් සකස් කර තිබු අතර පිරිපහදු පිරියතේ සැලසුම් කිරීමේ කොටස මෙම ව්‍යාපෘතිය මගින් නිම කිරීමට නියමිත විය. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒ සඳහා ඉඩමක් තෝරාගෙන තිබු අතර අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2014 වර්ෂය අවසානයේ අරඹා 2019 ජුනි 17 වන විට නිම කර තිබුණි. කෙසේ වුවද, ඉඩම් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවා තිබු අත්තිකාරම් මුදල් ආපසු අය කර ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගොනු කරන ලද නඩුවේ තීන්දුව ප්‍රමාද වීම මත 2022 මැයි 25 දින වන විටත් ඉඩමේ නිත්‍යානුකූල හිමිකම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. | ඉඩම් සඳහා ගෙවනලද අත්තිකාරම වෙනුවෙන් අධිකරණයේ නඩුවක් විභාග වන බැවින්, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා යොමුවීමට තීරණය කරන ලදී. | ඉඩම් අත්පත් කර ගැනීම ඵලදායීව, අර්ථිකව හා කාර්යක්ෂම අයුරින් සිදුකල යුතුය. |